# බන්ධනාගාර භාෂා ව්‍යවහාර (බෝගම්බර බන්ධනාගාරය ඇසුරින්)

ඩබ්ලිව්.ඩී.එන්.ඩී. විතානගේ - සිංහල අධ්‍යයනාංශය

භාෂාව යනු භාෂක සමාජයක සාමාජිකයන් විසින් ඔවුනොවුන් අතරේ අදහස් හුවමාරු කර ගැනීම සඳහා යොදා ගනු ලබන ප්‍රබලතම උපකරණයකි. භාෂාවේ ප්‍රධාන කාර්ය ඒ සංස්කෘතියේ සහ උපසංස්කෘතියේ අරමුණු තීරණය කිරීම වේ. එය ඒ සාමාජිකයන්ගේ සම්මුතියෙන් ම නිර්මාණය වූවක් වන අතර, බන්ධනාගාර භාෂාව ද එපරිද්දෙන් ම නිර්මාණය වූවකි. "එය මත්ද්‍රව්‍ය, ලිංගිකත්වය සහ ප්‍රචණ්ඩත්වය පදනම් කරගනිමින් නිර්මිත අපභාෂණයකි. එහි නොසරුප් වහර හෙවත් තහංචි භාෂණ ලක්ෂණ දක්නට ලැබෙන බවට" විදේශීය විද්වතුන් පවසයි. නමුත් මෙවන් පර්යේෂණයක් ලංකාවේ බන්ධනාගාර අලළා මෙතෙක් සිදුකර නොමැත. එම පර්යේෂණ හිඩැස සම්පූර්ණ කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණයි. බන්ධනාගාර භාෂා ව්‍යවහාරය සකස්වන්නේ කෙසේ ද? යන සමස්ත පර්යේෂණයෙන් කොටසක් පදනම් කරගනිමින් මෙම පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව බන්ධනාගාර භාෂා ව්‍යවහාරය නැමැති පරිමිත භාෂා ව්‍යවහාරය සකස් වීම කෙරෙහි මත්ද්‍රව්‍ය සහ ලිංගිකත්වය යන කරුණුවල බලපෑම කවරාකාරවේද? යන්න සොයා බැලෙයි. මෙහි දී අපභාෂණ, තහංචි, පරිමිත භාෂා යන සමාජවාග්විද්‍යාත්මක සිද්ධාන්ත පදනම් කරගනිමින් පිරික්සන ලදි. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ක්‍රමවේදය උපයුක්ත වන අතර, ප්‍රධාන වශයෙන් බෝගම්බර හෙවත් පල්ලෙකැලේ බන්ධනාගාරය යොදා ගැනිණි. අවුරුදු පහට වඩා වැඩි සිර දඬුවම් විඳින රැඳවියන් හතළිස්දෙනෙකු යොදාගත් මෙහි දී අතර එය ස්ත්‍රීන් විසිදෙනෙකුගෙන් සහ පුරුෂයින් විසිදෙනෙකුගෙන් යුත් නියැදියක් විය. ප්‍රධාන පර්යේෂණ ගැටලුව උදෙසා මත්ද්‍රව්‍ය, ලිංගිකත්වය සහ ප්‍රචණ්ඩත්වය යන කරුණු පදනම් කරගෙන නොසරුප් වහර හෙවත් තහංචි (taboo), අපභාෂණ (slang) යන භාෂණ ලක්ෂණවල එකතුවෙන් බන්ධනාගාර භාෂා ව්‍යවහාරය නිර්මාණය වන්නට ඇතැයි යන්න උපකල්පනය කෙරුණ ද මෙම පර්යේෂණ පත්‍රිකාව තුළ මත්ද්‍රව්‍ය සහ ලිංගිකත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු කරයි. ඒ ආශ්‍රයෙන් දත්ත එක්රැස් කිරීම සිදු කෙරුණු අතර, ඒ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි යන විධික්‍රම භාවිත කරන ලදි. පර්යේෂිත කරුණු අනුව පැහැදිලි වනුයේ, බන්ධනාගාර භාෂා ව්‍යවහාරය මත්ද්‍රව්‍ය සහ ලිංගිකත්වය පදනම් කරගනිමින් ගොඩනැගුණු නොසරුප් වහරක් වන බවයි. එය තහංචි සහ අපභාෂා යන ලක්ෂණවලින් සමන්විත වූ පරිමිත භාෂාවක් ලෙස ද හඳුනාගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *බන්ධනාගාර උපසංස්කෘතිය, පරිමිත භාෂා, අපභාෂණ, තහංචි වචන*